**සේවක අර්ථසාධක අරමුදල - 2023**
**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සේවක අර්ථසාධක අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, සාමාජිකයන්ගේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ක්ෂය ගණනය කිරීමේ උප ලේඛනය අනුව, සම්පූර්ණයෙන් ක්ෂය අවසන් කර තිබූ ස්ථාවර වත්කම්වල වටිනාකම කම්කරු දෙපාර්තමේන්තුවට හා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයට අදාලව පිළිවෙලින් රු.මිලියන 644.89ක් හා රු.මිලියන 167.01ක් විය. එම වත්කම් අතරින් තවදුරටත් භාවිතා කරනු ලබන වත්කම් හඳුනාගෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය සමාලෝචනය නොකිරීමෙන් සිදු වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව නිවැරදි කිරීමටත් තවදුරටත් භාවිතයට ගනු නොලබන වත්කම් සුදුසු පරිදි අපහරණය කිරීමටත් කටයුතු කර නොතිබුණි. | සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ ස්ථාවර වත්කම් සඳහා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සුදුසු පරිදි කටයුතු කිරීමටත්, භාවිතයට නොගන්නා ස්ථාවර වත්කම් ඉදිරි වසර තුළදී සුදුසු පරිදි අපහරණය කිරීමටත් සැලසුම් කර ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව කටයුතු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | අරමුදල විසින් පවත්වාගෙන යන බැංකු ගිණුම් 09කට අදාලව 2023 දෙසැම්බර් 31 දිනට සකස් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව 2001 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයට අදාලව මුදල් පොතේ සටහන් වූ නමුත් බැංකු ප්‍රකාශයේ සටහන් නොවූ ගනුදෙනු, බැංකු ප්‍රකාශයේ සටහන් වූ නමුත් මුදල් පොතේ සටහන් නොවූ ගනුදෙනු, අගරු වූ චෙක්පත්, ඍජු හර/බැර, පරිගණක ගිණුම්කරණ පද්ධතියේ දෝෂයක් ලෙස 2006 වර්ෂයේ සිට පවතින ශේෂය, තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ මුදල් ඇණවුම් සහ චෙක්පත් හා නිකුත්කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් ලෙස ගැලපුම් කල පසු ශුද්ධ ශේෂයන්හි එකතුව රු.මිලියන 4,757.69 ක් නිරවුල් නොකරන ලද ශේෂ ලෙස පැවතුණි. ඉන් රු.මිලියන 1,336.98 | බැංකු ගිණුම් 4කට අදාළ ගැටලු හඳුනාගෙන අදාල බැංකු සැසඳුම් ප්‍රකාශන සහ ගැලපීම් පිළිබඳ විස්තර සකස් කර ඇත. කෙසේ වෙතත් ලංකා බැංකුවේ ප්‍රධාන ගිණුම අනෙකුත් සියලු ගිණුම් සමඟ අන්තර් සම්බන්ධ වීම හේතුවෙන් එම ගිණුමේ නිරවුල් කිරීම් කරන විට අනෙක් බැංකු ගිණුම් 4 හි තවත් නිරාකරණ වීම් සිදු විය හැකි බැවින් අදාළ ගැලපීම් 2023 අවසන් ගිණුම් සැකසීමට යොදා නොගන්නා ලදී. තවද, 2018 වර්ෂයට පෙර සැසඳීමට නොහැකි වූ ශේෂ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | දිර්ඝ කාලයක සිට පැවත එන මෙම බැංකු ගිණුම් වල ගණුදෙනු නිරවුල් කිරීමට කළමනාකරණය අවධානය යොමු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක ශුද්ධ ශේෂයක් 2024 අප්‍රේල් 30 වන විටත් නිරවුල් කර නොතිබුණි. මෙම නිරවුල් නොකරන ලද ශුද්ධ ශේෂය තුල ඇතුලත් රු.මිලියන 273.72 ක් මුදල් පොතෙහි නිරවුල් නොකල රු.මිලියන 5,175.11 ක ගනුදෙනු හා බැංකු ප්‍රකාශනයෙහි නිරවුල් නොකල රු.මිලියන 5,448.83 ක ගනුදෙනු එකිනෙකට හිලව් කර දක්වා තිබූ අගයක් වූ අතර එම ශේෂයන් 2018 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයන් වේ. | | |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මෝටර් රථ පිරිවැය රු.මිලියන 97.20ක් ද, සමුච්චිත ක්ෂයවීම් රු.මිලියන 56.09ක් ද, ශුද්ධ අගය රු.මිලියන 41.11ක් ද විය. මෙම ශේෂයන් 2018 වර්ෂයේ සිට නොවෙනස්ව මූල්‍ය ප්‍රකාශනවල පවතින බැවින් 2018 වර්ෂයේ සිට රු.මිලියන 41.11ක් වූ මෝටර් රථ ක්ෂය ගණනය සඳහා යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය. | මෝටර් වාහන ප්‍රත්‍යාගණනක් තුළින් ඒවායේ වර්තමාන වෙළෙඳපොළ අගය හා ඵලදායී ජීව කාලය සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ. | අරමුදලෙහි ස්ථාවර වත්කම් ක්ෂය වීම් ප්‍රතිපත්තිය අනුව ස්ථාවර වත්කම් ක්ෂය ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මෝටර් රථ පිරිවැය රු.මිලියන 97.20ක් විය. විගණනය වෙත ලබා දුන් තොරතුරු අනුව අරමුදලින් මේ දක්වා මූල්‍යනය කරන ලද මෝටර් රථ 42 ක් පවතින අතර එහි පිරිවැය එකතුව රු.මිලියන 140.58ක් වේ. ඒ අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සඳහන් මෝටර් රථ පිරිවැයෙහි සහ අරමුදලින් මූල්‍යනය කරන ලද මෝටර් රථ පිරිවැයෙහි රු.මිලියන 43.38 ක වෙනසක් නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවට අයත් සියලුම වාහන හඳුනාගෙන එකී වාහන අත්පත් කර ගැනීමේ වැය විෂයය අනුව හෝ පවරා දීම අනුව නිවැරදි වාහන සංඛ්‍යාව මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කල හැකිය. දැනටමත් වාහන සත්‍ය පිරිවැය සිගාස් පද්ධතිය තුලින් හඳුනා ගත හැකි අතර සමස්ත ලේඛනය තුල මෙම වාහන හඳුනා ගනිමින් නිවැරදි කිරීම් ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ. | අරමුලෙහි ප්‍රතිපාදන මඟින් මූල්‍යනය කරන සියලුම වත්කම් අරමුදලෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ඇතුලත් කළ යුතුය. |
| (ඈ) | 2023 දෙසැම්බර් 31 දිනට “මෙහෙවර පියස අභ්‍යන්තර නිර්මිත සැකසීමේ නොනිමි වැඩ” ගිණුමෙහි වූ රු.මිලියන 297.89ක ශේෂය කාර්යාල සවිකිරීම් ලෙස ප්‍රාග්ධනීත කර ක්ෂය වීම් ගිණුම්ගත කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | නොනිමි වැඩ ගිණුම පරීක්ෂා කර සත්‍ය ස්ථාවර වත්කම් හඳුනාගෙන ඉදිරියේදී ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාවර වත්කම් භාවිතයට ගතහැකි තත්ත්වයට පැමිණි දින සිට ප්‍රාග්ධනිතකර ක්ෂය ගණනය කළ යුතුය. |
| (ඉ) | 2023 දෙසැම්බර් 29 දින කම්කරු මහලේකම් කාර්යාලයේ පළමු මහලෙහි අභ්‍යන්තර නිර්මිත සැකසීම වෙනුවෙන් රු.මිලියන 24.56ක් දරා තිබුණු අතර එම වටිනාකම ප්‍රාග්ධනීත කිරීම වෙනුවට ගොඩනැගිලි වැඩිදියුණු කිරීමේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | සත්‍ය ස්ථාවර වත්කම් හඳුනාගෙන ඉදිරියේදී ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රාග්ධන හා අයහාර වියදම් පැහැදිලිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කල යුතුය. |

### 1.5.3 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාතර්ා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.මිලියන) | අනුරූපී වාතර්ා අනුව වටිනාකම (රු.මිලියන) | වෙනස (රු.මිලියන) | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| සාමාජික ගිණුම් ශේෂයෙහි ඇතුළත් උප ගිණුම් 5ක ශේෂය | 94,633 | 78,693 | 15,940 | කේවල ගිණුම් මුදල් පදනමින් පවත්වා ගෙන යනු ලබන අතර පොදු ලෙජරය තුල ගනුදෙනු වාර්තා කරනුයේ උපචිත පදනමිනි. මේ නිසා මෙම පද්ධති දෙකෙහි කිසියම් දිනෙක පවතින ශේෂයන්හි ස්වාභාවිකවම වෙනසක් පවතී. පද්ධති දෙකෙහිම සාමාජික ගිණුම් ශේෂයන්හි සිදුවන දෛනික ගනුදෙනු වාර්තා වීම තහවුරු කිරීම පිණිස දෛනිකව මෙම පද්ධති දෙකෙහි ගිණුම් සසඳා ඇත. | වෙනස සඳහා සැසඳුම් ප්‍රකාශන සකස් කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල (රු.මිලියන) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ | 1,154.03 | කේත අංකය, මිලදී ගත් දිනය, ස්ථාවර වත්කම් පිරිවැය සහ වත්කම් ස්ථාපිත කර ඇති ස්ථානය ආදී මූලික තොරතුරු ඇතුලත් වත්කම් ලේඛනය | සියලුම ස්ථාවර වත්කම් සහිත ලේඛනයක් නොමැති අතර 2016 සිට අරමුදල යටතේ මිලදී ගත් වත්කම්, කාණ්ඩ අනුව සිගාස් මාදුකාංගයේ ඇතුළත් කර ලේඛනගත කර ඇත. | අරමුදලෙහි වත්කම් සම්බන්ධයෙන් විධිමත් ලේඛන නඩත්තු කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛ | | | |
| (i) | 1999 පෙබරවාරි 11 දිනැති අංක 01/99 දරන චක්‍රලේඛය | 2018 සිට 2023 දක්වා වර්ෂවලට අදාලව ආයතන පරීක්ෂා කටයුතු සිදු කර එකතුව රු.මිලියන 103ක අධිභාර හා දායක මුදල් අය කර | අය කිරීම් සඳහා රැගෙන එන D66 හෝ C වාර්තා දත්ත පද්ධතියට ඇතුලත් කිරීමෙන් පසු | දායක මුදල් හා අධිභාර අයකර ගැනිම සඳහා නිවේදන |

| | | | | |
|---|---|---|---|---|
| | | ගැනීමේ ප්‍රථම නිවේදනය නිකුත් කිරීම සඳහා දින 22 සිට දින 1438ක් දක්වා වූ කාලයක් ගත වී තිබූ අවස්ථා 70ක් ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය සම්බන්ධයෙන් සිදු කල විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද අවස්ථා 05කට අදාලව අය විය යුතු රු.මිලියන 13.46ක් අය කර ගැනීමට අවසන් නිවේදන නිකුත් කර නොතිබුණි.<br>උතුරු කොළඹ, ගම්පහ හා කළුතර දිස්ත්‍රික් කම්කරු කාර්යාල වලට අදාලව 2020 සිට 2023 දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් දායක මුදල් හා අධිභාර ලෙස පිළිවෙලින් ආයතන 61කට, 16කට හා 8කට අදාලව රු.මිලියන 52.73ක්, රු.මිලියන 95.22ක් හා රු.මිලියන 7.96ක් අයකර ගැනීමට පැවතුණි. | නිරීක්ෂණය වන අඩුපාඩු නිවැරදි කිරීමට කාලයක් ගත වීම, පරිගණක අක්‍රිය වීම, සේවායා විසින් වාරික සහන ඉල්ලීම් කිරීම, අදාල ගණනයන් සංශෝධන කළයුතු අවස්ථා පැවතීම, ආයතන ලිපින හැරගොස් තිබීම, ආයතන වසා දමා තිබීම, සේවායා සොයා ගත නොහැකි වීම වැනි කරුණු හේතුවෙන් ප්‍රමාදයන් සිදුව ඇත. | ප්‍රමාදයකින් තොරව යැවීම තුලින් සාමාජිකයින්ට ප්‍රශස්ථ සේවයක් ඉටු කල යුතුය. |
| (ii) | 2000 පෙබරවාරි 10 දිනැති අංක 6/2000 දරන චක්‍රලේඛයේ 1(IV) වගන්තිය | 2023 සැප්තැම්බර් 11 දිනට අරමුදලෙහි අධික්ෂණ දත්ත පද්ධතියට අනුව ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට අදාලව ලියාපදිංචි සක්‍රිය ආයතන 4835ක් හා අක්‍රිය/ වැසු ආයතන 411ක් විය. ආයතන පරීක්ෂාවන් සිදු කිරීමේදී දිගු කාලයකින් පරීක්ෂාවට භාජනය නොවූ ආයතන පරික්ෂාව සඳහා තෝරා ගත යුතු බවට චක්‍රලේඛය මඟින් උපදෙස් ලබා දී තිබුණද උක්ත ආයතන අතරින් සියයට 84ක් 2018 වර්ෂයේ සිට 2023 සැප්තැම්බර් 11 දක්වා කාල පරිච්ඡේදයේදී පරීක්ෂා කර නොතිබුණි. තවද, ගම්පහ කලාපයට අයත් ලියාපදිංචි ආයතන අතරින් ආයතන 8,483ක් උපකලාපවලට විභජනයකර නොතිබීම හේතුවෙන් එම ආයතන සම්බන්ධයෙන් අධීක්ෂණයක් සිදු නොවන බව නිරීක්ෂණය විය. | කම්කරු නිලධාරීන් සතියකට දින 03ක් ක්ෂේත්‍ර කටයුතුවල නිරතවන අතර මාසකට ආයතන 20කට ආසන්න ප්‍රමාණයක් එක් නිලධාරියෙකු විසින් පරීක්ෂා කරනු ලබයි. තවද, සහකාර කම්කරු කොමසාරිස් විසින් සෑම කම්කරු නිලධාරියෙකුගේම පරීක්ෂා කළ යුතු ආයතන ලැයිස්තුවට අක්‍රිය ආයතන 05ක් ඇතුලත් කරනු ලැබේ. | දිගුකාලයකින් පරික්ෂාවට ලක් නොවූ ආයතන සම්බධයෙන් පරික්ෂාවන් සිදු කිරීමටත් උප කලාපවලට වෙන් නොකළ ආයතන උප කලාපවලට වෙන් කර පරීක්ෂාවන් සිදු කිරීමටත් කටයුතු කල යුතුය. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදලේ 15 වන වගන්තිය | යම් ආයතනයක සේවකයින්ට අදාල දායක මුදල් සෑම මාසයක් අවසාන වී එළඹෙන මාසයේ අවසාන දිනට පෙර අරමුදල වෙත | ලියාපදිංචි ආයතන වලින් දායක මුදල් ගෙවා නොතිබූ ආයතන හඳුනාගෙන කම්කරු | පසු විපරම් කටයුතු විධිමත්ව කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රේෂණය කල යුතු වුවත්, උතුරු කොළඹ හා ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාල බල ප්‍රදේශයට අයත් 2022 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද ආයතන පිළිවෙලින් 89ක් හා 109ක් වෙතින් 2023 දෙසැම්බර් 31 දින වන විටත් ලියාපදිංචි දින සිට අදාල දායක මුදල් ගෙවා නොතිබුණද ඒ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි. | නිලධාරීන් ලවා පසු විපරම් කිරීම සඳහා සුදුසු පියවර ගෙන ඇති බව | |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 3.4 | ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ලියාපදිංචි සැපයුම්කරුවන් හෝ දුරකථන නාමාවලියේ කහ පිටුවල සහ රේන්බෝ පිටුවල ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් තෝරාගෙන මිල ගණන් කැඳවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 27.89ක් වූ පරිගණක, කැමරා සහ ප්‍රින්ටර් මිලදී ගැනීමේදී මිල ගණන් කැඳවීම සඳහා සැපයුම්කරුවන් තෝරා ගත් ක්‍රමවේදය හෙළිදරව් නොවීය. | මෙම සැපයුම්කරුවන් අදාළ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් දිගුකාලීනව නියැලෙන සැපයුම්කරුවන් වන බැවින් මිළ ගණන් කැඳවන ලද අවස්ථාව වන විට රේන්බෝ පිටුවල ලියාපදිංචි වී ඇති බවට තහවුරුවක් ලබා දීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුගතව විනිවිදභාවයකින් යුතුව ප්‍රසම්පාදනයන් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 467,193ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 313,934 ක් විය. ඒ අනුව මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.මිලියන 153,259 ක වර්ධනයක් නිරීක්ෂණය විය. අරමුදලෙහි පොළී ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 93,150 කින් වර්ධනය වීමත් මූල්‍ය උපකරණවල සාධාරණ අගය ගැලපීම තුලින් රු.මිලියන 23,836ක ලාභයක් හඳුනා ගැනීමත් මෙම වර්ධනයට හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලැයිස්තුගත නොවූ සමාගම්වල කොටස් ආයෝජනයෙන් රු.මිලියන 5,000ක් එනම් සියයට 52ක් 2013 වර්ෂයේදී පුද්ගලික සමාගමක ආයෝජනය කර තිබූ අතර එම සමාගම යටතේ ක්‍රියාත්මක කිරීමට පැවති ග්‍රෑන්ඩ් හයට් කොළඹ ව්‍යාපෘතියේ ඉදිකිරීමේ කටයුතු 2021 දෙසැම්බර් 27 වන විට අවසන් කල යුතුව පැවතුන ද එම ව්‍යාපෘතිය | අදාළ සමාගම රාජ්‍ය ආයතනයක් වන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව යටතේ ඇති පරිපාලිත (Subsidiary) සමාගමක් වන අතර එය විකුණා දැමීම සඳහා අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇති බව වාර්තා වේ.<br>ඒ අනුව, මුදල්, ආර්ථික ප්‍රතිසංස්කරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍යය ආයතන ප්‍රතිසංස්කරණ | අවධානම අවම වන ප්‍රශස්ථ ආයෝජනයන් සිදු කළ යුතු අතර ආයෝජනය කළ මුදල නැවත ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාත්මක කල නොහැකි බව අදාල සමාගම විසින් දන්වා තිබුණි. එසේම, රාජ්‍ය ආයතන ප්‍රතිසංස්කරණ ඒකකය විසින් මෙම සමාගම විකුණා දැමීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදන කරමින් පවති. එබැවින් යථෝක්ත ආයෝජනය සිදු කර වර්ෂ 11ක් ගත වුවද ආයෝජනයෙන් කිසිදු ප්‍රතිලාභයක් අරමුදලට ලැබී නොතිබුණි. | ඒකකය විසින් එම සමාගම විකුණා දැමීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් සිටියි. | |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට ලැයිස්තුගත සමාගම් 15ක සිදුකර තිබූ රු. මිලියන 17,401.39ක් වූ සාමාන්‍ය කොටස් ආයෝජනයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ද, ලැයිස්තුගත සමාගම් 09 ක සිදුකර තිබූ රු. මිලියන 4,390.49ක් වූ සමාන්‍ය කොටස් ආයෝජනයන් වෙනුවෙන් 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ද අරමුදලට ප්‍රතිලාභ ලැබී නොතිබුණි. | 2019-2022 කාල පරිච්ඡේදයේදී රට තුල පැවති අර්බුදකාරී තත්ත්වයන් හේතුවෙන් මෙම ආයතන විසින් එකී වර්ෂවලදී ලාභාංශ ප්‍රකාශ කර නොතිබුණි. මෙම සමාගම්වල මෙහෙයුම් කටයුතු 2023 වර්ෂයේදී වර්ධනය වූ අතර, එමගින් සුළු වශයෙන් ලාභ ඉපයීම් වාර්තා කිරීම හෝ අවම ලාභ තත්ත්වයන් වාර්තා කිරීමට ආරම්භ කර ඇත. ඒ අනුව, එම සමාගම්වලට ඉදිරියේදී ලාභාංශ ප්‍රකාශ කිරීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කරන බව. | සමාජිකයන්ට ඉහළ ප්‍රතිලාභ ලබා දීමට හැකි වන පරිදි ප්‍රශස්ථ ආයෝජනයන් කිරිමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සේවක අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචි නොවී සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි පමණක් ලියාපදිංචි වී තිබූ සේවායෝජකයින් සංඛ්‍යාව 2023 දෙසැම්බර් 31 දිනට 28,994ක් වූ අතර එම සේවායෝජකයන්ගෙන් එදිනට සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට ලැබී තිබූ දායක මුදල්වල එකතුව රු.මිලියන 401.25ක් විය. ඒ අනුව එම සේවායෝජකයින් අතරින් අරමුදලෙහි ලියාපදිංචි විය යුතු එහෙත් ලියාපදිංචි වීම පැහැර හැර ඇති සේවායෝජකයින් හඳුනාගෙන අරමුදෙලහි ලියාපදිංචි කිරීම සඳහා මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය වී සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. | සේවක අර්ථසාධක අරමුදල් පනතින් ආවරණය වනසේවායෝජකයන් හඳුනාගෙන ඔවුන්ගේ ආයතන පිහිටි ප්‍රදේශය භාර කම්කරු නිලධාරීන් ලවා එම සේවායෝජකයන් සේවක අර්ථසාධක අරමුදලට බඳවා ගැනීම සඳහා කටයුතු කරනු ලබන බව. | ආයතන දෙක අතර මනා සම්බන්ධීකරණයක් තුලින් පනත ප්‍රකාරව අරමුදලෙහි ලියාපදිංචි විය යුතු ආයතන ලියාපදිංචි කර ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | අරමුදලෙහි බැංකු සැසඳුම් ප්‍රකාශනවල 2001 වර්ෂයේ සිට පැවත එන නොසැසඳුනු බැංකු ගිණුම් ශේෂ නිරවුල් කිරීම සඳහා 2020 ජනවාරි 09 වන දින පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර | අදාල ආයතනයේ අතුරු වාර්තාවක් 2020 ඔක්තෝබර් 30 වන දින ඉදිරිපත් කළ අතර ප්‍රධාන බැංකු ගිණුම නිරවුල් කිරීමේ කටයුතු අවසන් කර නොමැති බැවින් අදාළ ගැලපීම් 2023 අවසන් ගිණුම් සැකසීමට යොදා නොගන්නා ලදී. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර ප්‍රධාන බැංකු ගිණුමෙහි පවතින ගැටලු නිරාකරණය කළ යුතුය. |

ගිවිසුම්ගත දින සිට සති 08ක් තුල අවසන් වාර්තාව ඉදිරිපත් කළ යුතුව පැවතියත්, අදාළ ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු මෙම වාර්තාවේ දින වන විටත් අත්කර ගෙන නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට ගිවිසුම්ගත මුදලින් සියයට 50ක් එනම් රු. මිලියන 1.56ක් ගෙවා තිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලෙහි සාමාජික ගිණුම තුල "කම්කරු කොමසාරිස් ජනරාල්" නමින් පැවති ගිණුමෙහි සේවායෝජකයින්ට එරෙහිව නඩු පැවරීමෙන් අයකරගෙන ශ්‍රී ලංකා මහ බැංකුවෙහි රඳවාගෙන ඇති රු.මිලියන 12,237ක් වූ මුදල, කම්කරු දෙපාර්තමේන්තුවේ පොදු තැන්පතු ගිණුමක රඳවාගෙන තිබූ රු.මිලියන 440ක් වූ මුදල, "ජංගම වර්ෂයේ දායක මුදල් අංක 01" නමින් වූ ගිණුමේ පැවති රු.මිලියන 78,797ක ශේෂය, විවිධ හේතු මත සාමාජිකයින්ට නොගෙවා රඳවාගත් ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ වශයෙන් පවතින රු.මිලියන 1,009ක ශේෂය, ඌන/අතිරික්ත දායක මුදල් වශයෙන් පවතින රු.මිලියන 2,590ක ශේෂය සහ ඌන/අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් වශයෙන් පවතින රු.මිලියන 552ක ශේෂය ලැබිය යුතු සාමාජිකයන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.<br>ඉහත සඳහන් සාමාජික ගිණුම්වලට බැර නොකර පවතින ගිණුම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස 2013, 2016 හා 2017 වර්ෂවලදී රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ද නියෝග කර තිබුණි. | "සී" වාර්තා රහිතව යොමු කළ දායක මුදල් මෙන්ම අසම්පූර්ණ හෝ විෂමතා සහිත "සී" වාර්තා සමඟ යොමු කළ දායක මුදල් පැවතීම ආදී විවිධ හේතු මත මෙම ශේෂයන් කේවල ගිණුම්වලට බැර කිරීමෙහි අපහසුතා පවතී.<br>මෙම ශේෂ නිරාකරණය කිරීම සඳහා, සාමාජික නම් හා අංක විෂමතා සහිත දායක මුදල් විස්තර වාර්තා පිළිබඳව සේවායෝජකයන් දැනුම්වත් කිරීම, දෝෂ සහිත "සී" වාර්තා සඳහා මුළු මුදල මත 2% අධිභාරයක් පැනවීම, මංගත ක්‍රමය හරහා මුදල් විස්තර වාර්තා රැස් කිරීම, ස්වයංක්‍රිය සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයන් හඳුන්වා දීම ආදී ක්‍රියාමාර්ග ගෙන ඇත. | නිරවුල්කර නොමැති දායක මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කළුතර දිස්ත්‍රික් කම්කරු කාර්යාල බල ප්‍රදේශයට අයත් සේවායෝජක ආයතනයක් විසින් 2019 ඔක්තෝබර් සිට 2022 අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදයට අදාල දායක මුදල් ගෙවීම පැහැර හැරීම හේතුවෙන් රු.මිලියන 3.27ක් අයකර ගැනීමට පැවතුණි. එම මුදල වාරික 32කින් ගෙවීම සඳහා 2022 දෙසැම්බර් 30 දින අනුමැතිය ලබා දී තිබුණද 2024 ජුනි 30 | ඉතිරි හිඟ වාරික කඩිනමින් අයකර ගැනීමට ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | පසුවිපරම් කටයුතු සිදුකර හිඟ වාරික අයකර ගැනිමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දින වන විට ඉන් වාරික හතරක් එනම් 510,000 ක් පමණක් අරමුදල වෙත ගෙවා තිබූ අතර තවදුරටත් අයවිය යුතු රු. මිලියන 2.76 ක් අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | කළුතර දිස්ත්‍රික් කම්කරු කාර්යාල බල ප්‍රදේශයට අයත් සේවායෝජක ආයතනයක් විසින් 2011 ජනවාරි සිට 2020 දෙසැම්බර් දක්වා කාලය තුල දායක මුදල් නොගෙවීම මත විභාග වූ නඩුවක තීන්දුව ප්‍රකාරව රු.මිලියන 5.89ක මුදලක් අය කර ගෙන තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 වන විටත් සාමාජිකයින් 7 දෙනෙකුට විභජනය කල යුතු එකතුව රු.මිලියන 1.14ක් විභජනය කර නොතිබුණි. | සාමාජික නම් හා අංකවල පවතින දෝෂ අදාල ආයතනය විසින් නිරාකරණය කළ යුතු බැවින් ඒ සම්බන්ධව ආයතනය ලිඛිතව දැනුවත් කර ඇත. තොරතුරු ලද වහාම නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | පසුවිපරම් කටයුතු සිදුකර අදාල සාමාජිකයන්ට මුදල් විභජනය කළ යුතුය. |
| (ඈ) | සේවායෝජකයන්ට එරෙහිව නඩු පැවරීමෙන් අය කර ගත් මුදල් නිරවුල් කරන තුරු පොදු තැන්පතු ගිණුමක රඳවා තබා ගන්නා අතර 2023 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු.මිලියන 440.36ක් විය. ඉන් රු.මිලියන 87.06ක් 2009 වර්ෂයත් 2022 වර්ෂයත් අතර කාලපරිච්ඡේදයේදී අය කර ගන්නා ලද මුදල් වේ. මෙම මුදල් ලැබිය යුතු සාමාජිකයින් හඳුනාගෙන එම සාමාජිකයින්ගේ කේවල ගිණුම්වලට බැර කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් එම මුදල් ආයෝජනයෙන් ඉපයිය හැකිව පැවති ආයෝජන ආදායම සාමාජිකයින්ට අහිමි වී තිබුණි. | සේවක අර්ථසාධක අරමුදල් තැන්පතුවල විවිධ ආකාරයෙන් නඩු මගින් අයකර ගන්නා වාරික වශයෙන් එකතු වන මුදල් ඇතුලත්ව ඇති අතර සම්පූර්ණ මුදල එකතුවන තෙක් ගෙවීම් කිරීමට නොහැකි වීම, තැන්පත් මුදල් හිමියන් විදේශ ගත වීම, මුල් හිමිකරුවන් මියයාම හේතුවෙන් උරුමක්කරුවන් ඉදිරිපත් වන තෙක් සිටීම වැනි හේතු නිසා මෙම මුදල් ගෙවීම ප්‍රමාද වී ඇත. | අදාල සාමාජිකයන්ගේ හිමිකම තහවුරු කිරීමටත් එම හිමිකම මත සාමාජිකයන්ට ප්‍රශස්ථ ප්‍රතිලාභයක් ලබාදීමටත් කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2023 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් එකතුව රු.මිලියන 12,755.09ක් අයකර ගැනීම සඳහා බාහිර ආයතනවලට එරෙහිව නඩු 14,096ක් පවරා තිබුණි. ඉන් එකතුව රු මිලියන 2,420 ක් අයකර ගැනීම සඳහා පවරන ලද නඩු 4,381 ක් අක්‍රිය තත්ත්වයේද, එකතුව රු. මිලියන 1,232 ක් අයකර ගැනීම සඳහා පවරන ලද නඩු 2,138 ක් විවෘත වරෙන්තු තත්ත්වයේද පැවතුණි. තවද, බාහිර ආයතන විසින් අරමුදලට එරෙහිව එකතුව රු. මිලියන 201.3 ක් ඉල්ලුම්කර නඩු 62 ක් අධිකරණයෙහි පවරා තිබුණි. | සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 12,755.09ක් අයකර ගැනීම සඳහා අරමුදල විසින් බාහිර ආයතනවලට එරෙහිව පවරා තිබූ මුළු නඩු සංඛ්‍යාව 14,096ක්ද, බාහිර ආයතන විසින් අරමුදලට එරෙහිව මුළු වටිනාකම රු.මිලියන 201.3ක් ඉල්ලුම්කර අධිකරණයේ පවරා ඇති මුළු නඩු සංඛ්‍යාව 62 ක්ද විය.මෙම නඩු 62න් නඩු 32ක්ම 2015 හා 2019 වර්ෂයන් හි එක් පුද්ගලික ආයතනයක් විසින් අරමුදලට එරෙහිව පවරා තිබුණි. | අවශ්‍ය කටයුතු ඉටු කර හිග මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2024 මැයි 08 දිනට සාමාජිකයින් විසින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අරමුදල වෙත ඉදිරිපත් කල අයදුම්පත් අතරින් එදින වන විට ප්‍රතිලාභ නිදහස් කර නොතිබූ මුලු අයදුම්පත් | සාමාජිකත්වය හඳුනාගැනීමට නොහැකි ගොනු කමිටු සඳහා ඉදිරිපත් කර තිබීම, වසා ඇති ආයතන සම්බන්ධයෙන් පවතින ගැටළු, ව්‍යාජ | ප්‍රමාද වීම් වළක්වා සාමාජිකයන්ට ප්‍රශස්ථ සේවයක් ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සංඛ්‍යාව 5,559ක් විය. එම අයදුම්පත් අතරින් අයදුම්පත් 1344 ක් 2012 සිට 2023 දක්වා වර්ෂවලදී භාර ගන්නා ලද අයදුම්පත් වන අතර ඉන් අයදුම්පත් 463ක් දත්ත පද්ධතියට ඇතුලත් කිරීම පමණක් සිදු කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමෙන් තොරව පැවතුනි. තවද, අයදුම්පත් 81 හා 172 ක් පිළිවෙලින් ප්‍රතිලාභ ගෙවීම සඳහා බලය දීම (Claims for Authorization) සහ අනුමත කිරිම (Claims for Approval) යන අදියරයන්හි පැවතුනි. ප්‍රතිලාභ නිදහස් කිරිමේ ක්‍රියාවලිය සඳහා දිගු කාලයක් ගත කිරිම හේතුවෙන් සාමාජිකයන්ට අරමුදල් නිදහස් කිරීම ප්‍රමාද වීම තුලින් ඔවුන් හට අවාසිදායක තත්ත්වයක් උද්ගතවන බව නිරීක්ෂණය විය. | ලේඛන ඉදිරිපත් කර තිබීම, නඩු පැවරීම් හා විමර්ශනවලට යොමු කර ඇති ගොනු පැවතීම, ආදී විවිධ කරුණු හේතුවෙන් අයදුම්පත් සඳහා ප්‍රතිලාභ නිදහස් කිරීමට ප්‍රමාද වී ඇති බව. | |
| (උ) | ආයෝජන සඳහා ගෙවීම් නිෂ්කාශනය කිරිමේ පාලන ගිණුමෙහි (Investment Clearing Account) 2016 වර්ෂයේ සිට පැවත එන රු. මිලියන 8.2ක්ද, වත්කම් අපහරණය කිරීමේ ගිණුමෙහි පැවති 2023 වර්ෂයේදී වත්කම් අපහරණයෙන් ලද රු. මිලියන 2.79 ක්ද ලෙස එකතුව රු. මිලියන 10.99 ක් නිරවුල් කිරීමෙන් තොරව "වෙනත් ගෙවිය යුතු වියදම්" ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබුණි. | අදාල ශේෂයන් 2024 වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | නිරවුල් නොකරන ලද ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙහෙවර පියස ගොඩනැගිල්ලෙහි 2023 ඔක්තෝම්බර් මාසය වෙනුවෙන් පහසුකම් කළමනකරණ හා සේවා ගාස්තු සහ අභ්‍යන්තර පිරිසිදු කිරීම් සඳහා සේවා සපයන ආයතනය විසින් රු.මිලියන 6.55ක බිල්පතක් ඉදිරිපත් කර තිබු අතර, එය ගොඩනැගිල්ලෙහි ස්ථාපිත සියළුම ආයතනවලට විභජනය කිරීමෙන් තොරව සම්පූර්ණ මුදලම අරමුදලෙන් දරා තිබුණි. | දෙපාර්තමේන්තුව වෙත වෙන්වී ඇති වාර්ෂික ප්‍රතිපාදන උපයොජනය කරමින් ගෙවීම මත පැන නැගුනු තත්වයක් බව පෙනේ. | එක් එක් ආයතන සමඟ එළඹි ගිවිසුම් ප්‍රකාරව පොදුකාර්ය වියදම් විභජනය විභජනය කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදලේ සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය සඳහා එකතුව රු.මිලියන 27.89ක් වූ පරිගණක 60ක්, කැමරා 60ක් සහ මුද්‍රණ යන්ත්‍ර 60ක් මිලදී ගෙන තිබුණි. උක්ත | පනතේ සංශෝධනයන්ට අනුව නව සාමාජිකයින් විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ලියාපදිංචිය කිරීමට හැකි ධාරිතාවක් සහිත පරිගණකවලට අවධානය යොමු | ප්‍රසම්පාදනයන් ප්‍රශස්ථ අයුරින් සැලසුම් කල යුතු වීම සහ සමාජික අරමුදලින් වියදම් |

පරිගණක 60න් පළමු පරිගණක 30 මිලදී ගැනීමේදී යොදාගත් “මතක ධාරිතාව” පිරිවිතරය අවසන් පරිගණක 30 මිලදී ගැනීමේදී වෙනස් කර මිල ගණන් කැඳවා තිබූ අතර දෙවන අවස්ථාවේදී සඳහන් කර තිබූ පිරිවිතරය උක්ත ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත් බව ලිපිගොනු තුලින් තහවුරු විය. ඒ අනුව පළමු අවස්ථාවේ ඒකකයක් රු.335,328 ක් ද, දෙවන අවස්ථාවේ ඒකකයක් රු.141,400ක් ද බැගින් මිලදී ගෙන තිබීමෙන් එක් ඒකකයකට දළ වශයෙන් රු. 193,928ක් බැගින් රු.මිලියන 5.82ක් ඉතිරි කර ගැනීමේ හැකියාව පළමු අවස්ථාවේදී අහිමි කර ගෙන තිබුණි. තවද, 2022 ජුනි 01 දින මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා සැලසුම් කර තිබුණද, පරිගණක 51ක් කැමරා 53ක් හා මුද්‍රණ යන්ත්‍ර 50ක් 2024 මාර්තු 14 දින වන විටත් බෙදාහැරීමෙන් තොරව ගබඩාවෙහි පැවතීම හේතුවෙන් දරන ලද වියදමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා කර ගෙන නොතිබුණි.

කරමින් පිරිවිතර සකස් කරන ලදී. ඒ අනුව මුල් පරිගණක 30 එම පිරිවිතරයන්ට අනුව මිලදී ගන්නා ලදී. රජය විසින් ගත් ප්‍රතිපත්තිමය තීරණයකට අනුව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ Electronic National Identity Card Project – e NIC ව්‍යාපෘතිය හේතුවෙන් වෙනම ඇඟිලි සලකුණු ලබා ගැනීමට අවශ්‍ය නොවන බවට කම්කරු කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරන ලද බැවින් එම ඇඟිලි සලකුණු ලබා ගැනීමට අවශ්‍ය පිරිවිතරයන් ඉවත් කර පරිගණක සඳහා නැවත පිරිවිතර සකස් කරන ලදී.

දැරීමේදී ඵලදායි ලෙස අරමුදල් උපයෝජනය කල යුතුය.